# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## 2018 ජුනි මස 22 වන දින

## II වන කොටස

## අතිරේකය

(2018.06.25 දින නිකුත් කරන ලදී)

# හානිපූරණය සඳහා වන කාර්යාලය

**හානිපූරණය සඳහා වන කාර්යාලය පිහිටුවීම පිණිස ද; හානිපූරණය සඳහා යෝග්‍ය පීඩාවට පත් තැනැත්තන් හඳුනාගැනීම සඳහා සහ එම තැනැත්තන්ට තනි සහ සාමූහික හානිපූරණයන් ලබාදීම සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද; 1987 අංක 29 දරන තැනැත්තන්, දේපළ සහ කර්මාන්ත පුනරුත්ථාපනය කිරීමේ අධිකාරිය පනත ඉවත් කිරීම පිණිස සහ ඊට සම්බන්ධ හෝ ඊට ආනුෂංගික කාරණා සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද වූ පනත් කෙටුම්පතකි**

අග්‍රාමාත්‍යතුමාගේ නියමය පරිදි පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිල දී ලබාගත හැක.

මිල : රු. 40.00 තැපැල් ගාස්තුව : රු. 15.00

මෙම ගැසට් අතිරේකය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

# හානිපූරණය සඳහා වන කාර්යාලය

එල්.ඩී.—ඕ. 12/2018

**හානිපූරණය සඳහා වන කාර්යාලය පිහිටුවීම පිණිස ද; හානිපූරණය සඳහා යෝග්‍ය පීඩාවට පත් තැනැත්තන් හඳුනාගැනීම සඳහා සහ එම තැනැත්තන්ට තනි සහ සාමූහික හානිපූරණයන් ලබාදීම සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද; 1987 අංක 29 දරන තැනැත්තන්, දේපළ සහ කර්මාන්ත පුනරුත්ථාපනය කිරීමේ අධිකාරිය පනත ඉවත් කිරීම පිණිස සහ ඊට සම්බන්ධ හෝ ඊට ආනුෂංගික කාරණා සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද වූ පනතකි.**

පූර්විකාව.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් සියලු ශ්‍රී ලාංකිකයන්ගේ ආවේණික ගරුත්වය සහ සමාන සහ අහිමි කළ නොහැකි මානව හිමිකම් සහ මේ අයිතීන්ට ගරු කිරීම, ප්‍රවර්ධනය කිරීම සහ ආරක්ෂා කිරීම සඳහා වන රාජ්‍ය වගකීම පිළිගන්නා හෙයින් ද:

සියලු ශ්‍රී ලාංකිකයන්ගේ අයිතිවාසිකම් වෙනුවෙන් ස්ථාවර වූ සඵලදායී ප්‍රතිකර්මයක් වශයෙන් පරිපූර්ණ හානිපූරණය කිරීමේ යෝජනා ක්‍රමයක් අනාගත පරපුර ඇතුළත් සියලු ශ්‍රී ලාංකිකයන්ගේ සුබසිද්ධිය සහ ආරක්ෂාව උදෙසා ප්‍රතිසන්ධානය ප්‍රවර්ධනය කිරීම සඳහා දායක වන හෙයින් ද:

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:-

ලුහුඬු නාමය.

**1.** මේ පනත 2018 අංක    දරන හානිපූරණය සඳහා වන කාර්යාලය පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

පනතේ අරමුණු.

**2.** මේ පනතේ අරමුණු වන්නේ-

(අ) පීඩාවටපත් තැනැත්තන්ට තනි සහ සාමූහික හානිපූරණයන් ප්‍රදානය කිරීමට හානිපූරණය පිළිබඳ ප්‍රතිපත්තීන් විධිමත්ව සකස්කර කැබිනට් මණ්ඩලයට නිර්දේශ කිරීම;

(ආ) මහජන අධ්‍යාපනය, සිහිගැන්වීම සහ ළමයින්, තරුණයන්, කාන්තාවන් සහ ලිංගික හිංසනයට ලක් වූ වින්දිතයන් සහ දුබලතාවයන් සහිත තැනැත්තන් සම්බන්ධයෙන් වන විශේෂිත ප්‍රතිපත්ති ඇතුළුව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලද එම හානිපූරණය සඳහා වන ප්‍රතිපත්ති සඳහා පහසුකම් සැපයීම සහ ක්‍රියාත්මක කිරීම;

(ඇ) ප්‍රතිසන්ධානය අරමුණු කරගත් වෙනත් යාන්ත්‍රණයන් සමඟ අනුකූල වීම තහවුරු කිරීම සඳහා සබඳතා පිහිටුවීම; සහ

(ඈ) යෝග්‍ය පීඩාවටපත් තැනැත්තන්ට හානිපූරණයන් ලබා දීමේ ප්‍රගතිය අධීක්ෂණය කිරීම සහ අගය කිරීම.

I වන කොටස

**හානිපූරණය සඳහා වන කාර්යාලය පිහිටුවීම**

හානිපූරණය සඳහා වන කාර්යාලය පිහිටුවීම.

**3.** (1) හානිපූරණය සඳහා වන කාර්යාලය යනුවෙන් හඳුන්වනු ලබන කාර්යාලයක් පිහිටුවනු ලැබිය යුතු ය.

(2) හානිපූරණය සඳහා වන කාර්යාලය අවිච්ඡින්න පවැත්මක් සහ පොදු මුද්‍රාවක් සහිත සංස්ථාපිත මණ්ඩලයක් විය යුතු අතර එහි සංස්ථාපිත නාමයෙන් එය විසින් ද එයට විරුද්ධව ද නඩු පවරනු ලැබිය හැකි ය.

හානිපූරණය සඳහා වන කාර්යාලයෙහි සංස්ථාපනය.

**4.** (1) හානිපූරණය සඳහා වන කාර්යාලය, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ නිර්දේශය මත ජනාධිපතිවරයා විසින් පත් කරනු ලැබිය යුතු සාමාජිකයන් පස් දෙනෙකුගෙන් සමන්විත විය යුතු ය.

(2) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව විසින් ජනාධිපතිවරයා විසින් හානිපූරණය සඳහා වන කාර්යාලයේ සභාපතිවරයා වශයෙන් පත් කරනු ලැබීමට නම් තුනක් හානිපූරණය සඳහා වන කාර්යාලයේ සාමාජිකයින් අතරින් නිර්දේශ කරනු ලැබිය යුතු ය.

(3) (2) වන උපවගන්තිය යටතේ නිර්දේශිත සාමාජිකයන් අතරින් එක් සාමාජිකයෙක් ජනාධිපතිවරයා විසින් හානිපූරණය සඳහා වන කාර්යාලයේ සභාපතිවරයා ලෙස පත්කරනු ලැබිය යුතු ය.

(4) හානිපූරණය සඳහා වන කාර්යාලයට සාමාජිකයින් පත්කිරීම සඳහා නිර්දේශ සිදුකිරීමේ දී, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව විසින්,-

(අ) හානිපූරණය සඳහා වන කාර්යාලයේ සංයුතිය, ලිංග භේදය ඇතුළු ශ්‍රී ලාංකීය සමාජයේ බහුවිධ ස්වභාවය පිළිබිඹු කරන බව සහතික කරන බවට;

(ආ) හානිපූරණය සඳහා වන කාර්යාලයේ සාමාජිකයන් පරිපූර්ණ තැනැත්තන් වන බව සහ හානිපූරණය සඳහා වන කාර්යාලයේ කර්තව්‍යයන් ක්‍රියාත්මක කිරීමට අදාළ සුදුසුකම් සහ පළපුරුද්ද සතු බව සහතික කරන බවට,

නිසි සැළකිල්ලක් දක්වනු ලැබිය යුතු ය.

හානිපූරණය සඳහා වන කාර්යාලය සඳහා සභාපතිවරයා සහ සාමාජිකයන් පත්කිරීම.

**5.** (1) ජනාධිපතිවරයා විසින් 4 වන වගන්තිය යටතේ නිර්දේශ ලැබීමෙන් දින දහ හතරක කාලසීමාවක් ඇතුළත, 4 (2) වගන්තිය යටතේ නිර්දේශිත නම් අතුරින් හානිපූරණය සඳහා වන කාර්යාලයේ සාමාජිකයින් ලෙස යම් තැනැත්තන් සහ සභාපතිවරයා ලෙස තැනැත්තකු පත් කරනු ලැබිය යුතු ය.

(2) එකී දින දහ හතරක කාලසීමාව ඇතුළත ජනාධිපතිවරයා විසින් අවශ්‍ය පත් කිරීම් සිදු කිරීමට අපොහොසත්වන අවස්ථාවක දී, එම දින දහ හතරක කාලසීමාව ඉකුත් වන්නා වූ දිනයේ සිට බලාත්මක වන පරිදි -

(අ) හානිපූරණය සඳහා වන කාර්යාලයේ සාමාජිකයින් වශයෙන් පත් කිරීමට නිර්දේශිත තැනැත්තන්, හානිපූරණය සඳහා වන කාර්යාලයේ සාමාජිකයින් වශයෙන් පත් කරනු ලැබූ ලෙසින්; සහ

(ආ) සභාපතිවරයා වශයෙන් පත් කරනු ලැබීමට නිර්දේශිත නම් ලැයිස්තුවේ මුලින්ම නම සඳහන් වන තැනැත්තා, හානිපූරණය සඳහා වන කාර්යාලයේ සභාපතිවරයා වශයෙන් පත්කරනු ලැබූ ලෙසින්,

සළකනු ලැබිය යුතු ය.

සාමාජිකයන්ගේ ධුර කාල.

**6.** හානිපූරණය සඳහා වන කාර්යාලයේ සෑම සාමාජිකයකු විසින්ම, එකී සාමාජිකයා එම නිල කාලය ඉකුත් වීමට පෙර මිය යාම, ඉල්ලා අස්වීම හෝ ඉවත් වීම මත ධුරය හිස් කරනු ලබන්නේ නම් මිස, එම සාමාජිකයාගේ පත්වීමේ දිනයේ සිට වසර තුනක කාලසීමාවක් දක්වා, ධුරය දරනු ලැබිය යුතු අතර එකී සාමාජිකයා ඉවත් කරනු ලැබුවේ නම් හැර, නැවත පත් කරනු ලැබීම සඳහා සුදුසුකම් ලැබිය යුතු ය.

සාමාජිකයන් ඉවත් කිරීම.

**7.** (1) හානිපූරණය සඳහා වන කාර්යාලයේ යම් සාමාජිකයකුගේ ධුරය-

(අ) එකී සාමාජිකයා මිය යාම මත;

(ආ) එකී සාමාජිකයා ජනාධිපතිවරයා අමතා යවනු ලබන ලිපියක් මගින් ධුරයෙන් ඉල්ලා අස්වීම මත;

(ඇ) (2) වන උපවගන්තියේ නිශ්චිතව සඳහන් යම් හේතුවක් මත එකී සාමාජිකයා ඉවත් කිරීමට ලක්වීම මත; හෝ

(ඈ) එකී සාමාජිකයාගේ ධුර කාලය ඉකුත් වීම මත,

හිස්වනු ලැබිය යුතු ය.

(2) හානිපූරණය සඳහා වන කාර්යාලයේ යම් සාමාජිකයකු -

(අ) නිසි අධිකරණ බලය ඇති අධිකරණයක් විසින් වස්තු භංගත්වයට පත් වූවකු ලෙසින් විනිශ්චය කරනු ලැබ ඇත්නම්;

(ආ) ජනාධිපතිවරයාගේ අදහස අනුව, කථානායකවරයා සහ විපක්ෂ නායකවරයා විමසා, අග්‍රාමාත්‍යවරයා විසින් සිදුකරන ලද නිර්දේශය මත පදනම්ව, හානිපූරණය සඳහා වන කාර්යාලයේ සාමාජිකයකු වශයෙන් සිය කාර්ය ඉටුකිරීමේ දී බැඳියා පිළිගැටුමක් ඇති බවට සොයාගනු ලැබ ඇත්නම්;

(ඇ) රෝගාතුරවීම හෝ වෙන යම් මානසික හෝ ශාරීරික අශක්නුතාවකට පත්වීම හේතුවෙන් ධුරයේ අඛණ්ඩව කටයුතු කිරීමට නුසුදුසු වන්නේ නම්;

(ඈ) නිසි අධිකරණ බලය ඇති අධිකරණයක් විසින් සිහිවිකල් තැනැත්තකු බවට ප්‍රකාශයට පත්කරනු ලැබ ඇත්නම්;

(ඉ) දුරාචාරය සම්බන්ධ යම් වරදකට වරදකරු කරනු ලැබ ඇත්නම්; හෝ

(ඊ) හානිපූරණය සඳහා වන කාර්යාලයෙන් පූර්ව අනුමතය ලබා නොගෙන අනුගාමී රැස්වීම් තුනකට නොපැමිණ ඇත්නම්,

ජනාධිපතිවරයා විසින් එම තැනැත්තා ධුරයෙන් ඉවත් කරනු ලැබිය හැකි ය.

(3) සභාපතිවරයා විසින් ජනාධිපතිවරයා අමතා යවනු ලබන ලිපියක් මගින් සභාපති ධුරයෙන් ඉල්ලා අස්වනු ලැබිය හැකි ය.

(4) (1) වන සහ (2) වන උපවගන්තිවල විධිවිධානවලට යටත්ව, සභාපතිවරයාගේ ධුර කාලය, එම තැනැත්තන්ගේ හානිපූරණය සඳහා වන කාර්යාලයේ සාමාජිකත්ව කාලසීමාව විය යුතු ය.

(5) (අ) රෝගාතුරවීම හෝ වෙන යම් අශක්නුතාවයක් හෝ ශ්‍රී ලංකාවෙන් බැහැරව සිටීම හෝ එවැනි වෙනත් හේතුවක් නිසා ස්වකීය ධුරයේ කාර්ය ඉටුකිරීමට හානිපූරණය සඳහා වන කාර්යාලයේ සභාපතිවරයා තාවකාලිකව අපොහොසත් වන්නේ නම්, ජනාධිපතිවරයා විසින් 4(1) වගන්තියේ විධිවිධානවලට අනුකූලව, සභාපතිවරයා වෙනුවෙන් කටයුතු කිරීම සඳහා හානිපූරණය සඳහා වන කාර්යාලයේ වෙන යම් සාමාජිකයකු පත් කරනු ලැබිය හැකි ය.

(ආ) රෝගාතුරවීම හෝ වෙන යම් අශක්නුතාවක් හෝ ශ්‍රී ලංකාවෙන් බැහැරව සිටීම හෝ එවැනි වෙනත් හේතුවක් නිසා ස්වකීය ධුරයේ කාර්ය ඉටුකිරීමට හානිපූරණය සඳහා වන කාර්යාලයේ යම් සාමාජිකයකු තාවකාලිකව අපොහොසත් වන්නේ නම්, ජනාධිපතිවරයා විසින් 4(1) වගන්තියේ විධිවිධානවලට අනුකූලව, එම කාලසීමාව තුළ දී එකී සාමාජිකයා වෙනුවෙන් තාවකාලිකව කටයුතු කිරීම සඳහා වෙන යම් සුදුසුකම්ලත් තැනැත්තකු පත් කරනු ලැබිය හැකි ය.

(6) හානිපූරණය සඳහා වන කාර්යාලයේ සාමාජිකයන් අතර යම් පුරප්පාඩුවක් පැවතීම හෝ එහි යම් සාමාජිකයකු පත් කිරීමෙහිලා යම් දෝෂයක් තිබීමේ හේතුව නිසාම පමණක් හානිපූරණය සඳහා වන කාර්යාලයේ කිසිදු ක්‍රියාවක් හෝ නීති කෘත්‍යයක් අවලංගු වන බවට සලකනු නොලැබිය යුතු ය.

හානිපූරණය සඳහා වන කාර්යාලයේ රැස්වීම්.

**8.** (1) හානිපූරණය සඳහා වන කාර්යාලයේ සභාපතිවරයා විසින් හානිපූරණය සඳහා වන කාර්යාලයේ සියලුම රැස්වීම්වල මුලසුන ගත යුතු ය. සභාපතිවරයා හානිපූරණය සඳහා වන කාර්යාලයේ යම් රැස්වීමකට පැමිණ නොසිටියහොත්, එකී රැස්වීමට පැමිණ සිටින හානිපූරණය සඳහා වන කාර්යාලයේ සාමාජිකයන් විසින් එම රැස්වීමට පැමිණ සිටින සාමාජිකයන් අතරින් එක් සාමාජිකයකු එම රැස්වීමේ මුලසුන දැරීම සඳහා තෝරා පත් කර ගනු ලැබිය යුතු ය.

(2) සභාපතිවරයාට හෝ හානිපූරණය සඳහා වන කාර්යාලයේ එවැනි යම් රැස්වීමක මුලසුන දරන සාමාජිකයාට ඔහුගේ ඡන්දයට අමතරව තීරක ඡන්දයක් තිබිය යුතු ය.

(3) හානිපූරණය සඳහා වන කාර්යාලයේ රැස්වීමක ගණපූරණය සාමාජිකයන් තිදෙනෙකු විය යුතු ය.

(4) මේ පනතේ වෙනත් විධිවිධානවලට යටත්ව, හානිපූරණය සඳහා වන කාර්යාලයේ රැස්වීම් පැවැත්වීමට සහ එකී රැස්වීම්වල දී කටයුතු කිරීමට අදාළ කාර්ය පටිපාටිය නියාමනය කිරීමට හානිපූරණය සඳහා වන කාර්යාලය විසින් රීති සාදනු ලැබිය හැකි ය.

තොරතුරු නිලධරයා හා නම් කළ නිලධරයා.

**9.** හානිපූරණය සඳහා වන කාර්යාලයේ කාර්ය ආරම්භ වී මාස තුනක් ඇතුළත හානිපූරණය සඳහා වන කාර්යාලය විසින්, ඔවුන් අතුරින් එක් සාමාජිකයකු හෝ හානිපූරණය සඳහා වන කාර්යාලයේ

වෙනත් යම් නිලධරයකු, 2016 අංක 12 දරන තොරතුරු දැනගැනීමේ පනතේ 23 වන වගන්තිය අනුකූලව තොරතුරු නිලධරයා වශයෙන් පත්කරනු ලැබිය යුතු අතර එකී පනතේ පරමාර්ථ සඳහා හානිපූරණය සඳහා වන කාර්යාලයේ සභාපතිවරයා නම් කළ නිලධරයා විය යුතු ය.

මූලස්ථානය සහ ප්‍රාදේශීය කාර්යාල.

**10.** (1) හානිපූරණය සඳහා වන කාර්යාලයේ මූලස්ථානය, කොළඹ පිහිටා තිබිය යුතු ය.

(2) හානිපූරණය සඳහා වන කාර්යාලයේ අරමුණු සාක්ෂාත් කරගැනීමේ හා පීඩාවට පත් තැනැත්තන් සඳහා හානිපූරණයන් වෙත ප්‍රවේශ විය හැකි බව සහතික කිරීමේ කාර්යය සඳහා අවශ්‍ය විය හැකි යම් කොට්ඨාස සහ විහිදුම් ඒකකයක් ඇතුළත් ඒකක, ප්‍රාදේශීය, තාවකාලික හෝ ජංගම කාර්යාල සංඛ්‍යාවක්, හානිපූරණය සඳහා වන කාර්යාලය විසින් කලින් කලට පිහිටුවනු ලැබිය හැකි ය.

## II වන කොටස

### හානිපූරණය සඳහා වන කාර්යාලයේ බලතල සහ කර්තව්‍ය

හානිපූරණය සඳහා වන කාර්යාලයේ බලතල සහ කර්තව්‍ය.

**11.** (1) හානිපූරණය සඳහා වන කාර්යාලය සතුව පහත දැක්වෙන බලතල සහ කර්තව්‍ය පැවතිය යුතු යː-

(අ) 2016 අංක 14 දරන අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය (පිහිටුවීම, පරිපාලනය කිරීම හා කර්තව්‍ය ඉටුකිරීම) පනත (මෙහි මින් මතු "ඕ.එම්.පී" යනුවෙන් හඳුන්වනු ලබන) යටතේ පිහිටුවන ලද අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයෙන් හෝ එවැනි වෙනත් අදාළ මණ්ඩල හෝ ආයතන මඟින් පීඩාවට පත් තැනැත්තන් වෙත සිදුකළ යුතු හානිපූරණයන්ට අදාළව නිර්දේශ ලැබීම;

(ආ) පීඩාවට පත් තැනැත්තන්ගෙන් හෝ එකී පීඩාවට පත් තැනැත්තන්ගේ නියෝජිතයන්ගෙන් ඉල්ලීම් ලැබීම සහ එම ඉල්ලීම්වල හානිපූරණය කිරීම සඳහා වන යෝග්‍යතාව තක්සේරු කිරීමේ කාර්යය සඳහා එම ඉල්ලීම්වල තථ්‍යභාවය සත්‍යාපනය කිරීම;

(ඇ) හානිපූරණය සඳහා සුදුසු පීඩාවට පත් තැනැත්තන් මෙන්ම ඔවුන්ගේ අවශ්‍යතාවයේ මට්ටම හඳුනාගැනීම;

(ඇ) මධ්‍යගත දත්ත සමුදායක් මඟින් ආණ්ඩුව විසින් පෙර පවත්වාගෙන යනු ලැබූ සහ පවත්වාගෙන යනු ලබන හානිපූරණ යෝජනාක්‍රම පිළිබඳව එකී යෝජනා ක්‍රම වෙනුවෙන් දරනු ලැබූ වියදම් ඇතුළත් ව තොරතුරු හඳුනාගැනීම සහ තොරතුරු රැස්කර ගැනීම;

(ඉ) (i) නිර්දේශ සහ ඉල්ලීම් ලැබිය යුතු ආකාරය;

(ii) එම නිර්දේශ සහ ඉල්ලීම් සංසාධිත කළ යුතු සහ සත්‍යාපනය කළ යුතු ආකාරය; සහ

(iii) හානිපූරණය සඳහා වන කාර්යාලයේ පරිපාලනය,

ඇතුළුව, එහෙත් ඒවාට සීමා නොවී හානිපූරණය සඳහා වන කාර්යාලයේ නිසි ක්‍රියාකාරීත්වය සහතික කිරීමට අදාළ රීති සකස් කිරීම;

(ඊ) හානිපූරණය සඳහා වන කාර්යාලයේ බලතල සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම සහ ඉටු කිරීමට අදාළව එහි කාර්ය මණ්ඩලය විසින් අනුගමනය කළ යුතු ලිංගභේදය සහ ළමයින් පිළිබඳ ප්‍රත්‍යුත්තරදායී ප්‍රතිපත්තීන් ඇතුළත් රීති සහ මාර්ගෝපදේශ කලින් කලට සකස් කිරීම සහ නිකුත් කිරීම;

(උ) (i) හානිපූරණය ලබාගත හැකි සන්තාපයේ ස්වභාවයට සහ බරපතළකමට අදාළ නිර්ණායකය ඇතුළත්ව හානිපූරණ ලබා ගැනීම සඳහා පීඩාවට පත් තැනැත්තන්ගේ යෝග්‍යතාව මැන බැලීම සඳහා වන නිර්ණායක;

(ii) යෝග්‍ය පීඩාවටපත් තැනැත්තන් වෙත සපයනු ලබන හානිපූරණයන්ගේ ආකාරය සහ උචිත අවස්ථාවන්හි දී ඒවා සපයනු ලබන ප්‍රමාණය;

(iii) මූල්‍ය වන්දි සඳහා පීඩාවට පත් තැනැත්තන්ගේ යෝග්‍යතාව මැන බැලීම සඳහා වන නිර්ණායක;

(iv) නොපමාව ලබා දිය යුතු හානිපූරණය සඳහා පීඩාවටපත් තැනැත්තන්ගේ යෝග්‍යතාවය පිළිබඳ නිර්ණායකය;

(v) පීඩාවට පත් තැනැත්තන්ට විවිධ ආකාරයේ හානිපූරණයන් සැපයීම හෝ භාර දීම සඳහා සහාය විය හැකි මණ්ඩලයන්ගේ ලැයිස්තුව;

(vi) අනෙකුත් රාජ්‍ය ආයතන විසින් ඍජුව සැපයිය හැකි හානිපූරණයන් පිළිබඳ නිර්දේශ;

(vii) සත්‍යාපනය කරන ලද හානිපූරණ සඳහා වන ඉල්ලීම් සඳහා ප්‍රමුඛතාවය ලබා දීමට පදනම් කරගත යුතු නිර්ණායක,

ඇතුළත් තනි සහ සාමූහික හානිපූරණ ලබා ගැනීමට අදාළ හානිපූරණ ප්‍රතිපත්ති සහ මාර්ගෝපදේශ සකස් කිරීම සහ ඒවා අමාත්‍ය මණ්ඩලය වෙත නිර්දේශ කිරීම;

(ඍ) හානිපූරණය සඳහා වන කාර්යාලය විසින් ක්‍රියාත්මක කිරීම සඳහා අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරනු ලැබිය හැකි හානිපූරණ ප්‍රතිපත්ති සහ මාර්ගෝපදේශ ක්‍රියාත්මක කිරීම සහ එකී අනුමත හානිපූරණ ප්‍රතිපත්ති සහ මාර්ගෝපදේශ මගින් අපේක්ෂිත තනි සහ සාමූහික හානිපූරණ ප්‍රදානය කිරීම;

(එ) හානිපූරණය සඳහා වන කාර්යාලයේ කාර්ය මණ්ඩලයට ලිංගභේදය පිළිබඳ ප්‍රත්‍යුත්තරදායී බව ඇතුළත් පුහුණුව ලබා දීම;

(ඒ) හානිපූරණය සඳහා වන කාර්යාලය හමුවේ පෙනී සිටින පීඩාවට පත් තැනැත්තන් සඳහා අවශ්‍ය වූ විට පරිපාලනය සහාය, ප්‍රවාහන ගාස්තු ආපසු ගෙවීම සහ මනෝ සමාජයීය සහාය ඇතුළුව සහාය සැපයීම;

(ඔ) පීඩාවට පත් තැනැත්තන්ගේ ශාරීරික ඒකාග්‍රතාවයට තර්ජනයක් පිළිබඳ ධනාත්මක ඇගයීමක් පවතින්නේ නම්, නීතිය ක්‍රියාත්මක කිරීමේ ආයතනවල සහාය සහිතව ආරක්ෂාව සැලසීම;

(ඕ) පීඩාවට පත් තැනැත්තන්ට ඔවුන්ගේ අයිතිවාසිකම්, හානිපූරණයන් ලබා ගැනීම හා සම්බන්ධිත කාර්ය පටිපාටීන්, සත්‍ය සොයා ගැනීමේ යාන්ත්‍රණ සහ ඔවුන්ට සහන හෝ පිළියම් ලබා ගත හැකි වන්නා වූ අනෙකුත් යාන්ත්‍රණයන් පිළිබඳව තොරතුරු සහ උපදෙස් සැපයීම;

(ක) ඉවත් කරනු ලැබූ පනතේ 2 වන වගන්තිය යටතේ පිහිටුවනු ලැබූ තැනැත්තන්, දේපළ සහ කර්මාන්ත පුනරුත්ථාපනය කිරීමේ අධිකාරිය වෙත මේ පනත

බලාත්මක වීමේ දිනට පෙර කරන ලද හිමිකම්පෑම්, ඒ සඳහා වෙන්කර ඇති සම්පත්වල සුලභතාවට යටත්ව, සලකා බැලීම සහ ක්‍රියාත්මක කිරීම;

(ග) මේ පනත බලාත්මක වීමට පෙර, අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලද ඉවත් කරනු ලැබූ පනතේ 2 වන වගන්තිය යටතේ පිහිටුවනු ලැබූ තැනැත්තන්, දේපළ සහ කර්මාන්ත පුනරුත්ථාපනය කිරීමේ අධිකාරියේ යම් වැඩසටහන්, එම වැඩසටහන් නතර කරනු ලැබිය හැකි යම් කාලයක් තෙක් ක්‍රියාත්මක කිරීම;

(ච) අනෙකුත් තැනැත්තන් හෝ පුද්ගල මණ්ඩල විසින් පීඩාවට පත් තැනැත්තන්ට ප්‍රතිෂ්ඨාපනය, පුනරුත්ථාපනය සහ අනෙකුත් සහායන් සහ සෞඛ්‍ය සේවා, මානසික සාමාජීය සහාය, අධ්‍යාපනික සහ වෘත්තීය පුහුණු වැඩසටහන් ඇතුළු සුබසාධන සේවා ඇතුළත් අනෙකුත් ආකාරයන්ගේ සහාය සැපයීම සඳහා පහසුකම් සැපයීම;

(ජ) නිලධරයන්, සේවා නියුක්තිකයන් සහ සේවකයන් පත් කිරීම සහ ඔවුන්ගේ විනය පාලනය කිරීම හෝ ඉවත් කිරීම;

(ට) රාජ්‍ය අධිකාරීන් හෝ වෙනත් යම් මූලාශ්‍රයකින් විස්තර, වාර්තා, ලේඛන හෝ තොරතුරු ඉල්ලා සිටීම ඇතුළුව, හානිපූරණය සඳහා වන කාර්යාලයට එහි අරමුණු ඉටුකිරීම සඳහා අවශ්‍ය තොරතුරු රැස් කිරීම;

(ඩ) මේ පනතේ නිශ්චිතව සඳහන් කරන ලද යම් ඒකකයකට හෝ කොට්ඨාසයකට අමතරව හානිපූරණය සඳහා වන කාර්යාලයේ කාර්යක්ෂම පරිපාලනය සහ ක්‍රියාකාරීත්වයට අවශ්‍ය වන පරිදි යම් කමිටු, කොට්ඨාස සහ ඒකක පිහිටුවීම;

(ණ) හානිපූරණය සඳහා වන කාර්යාලයේ බලතල ක්‍රියාත්මක කිරීමේ දී සහ අරමුණු ඉටුකිරීමේ දී අවශ්‍ය විය හැකි යම් ගිවිසුම්වලට ඇතුළත් වීම;

(ත) යම් රජයකින්, රාජ්‍ය, පළාත් හෝ පළාත් පාලන ආයතනයකින්, හෝ නියෝජිතායතනයකින්, හෝ එහි යම් නිලධරයකුගෙන්, හෝ වෙනත් යම් තැනැත්තකුගෙන් හෝ පුද්ගල මණ්ඩලයකින් එහි අරමුණු ඉටුකර ගැනීම සඳහා අවශ්‍ය වන්නා වූ සහාය ඉල්ලා සිටීම සහ ලබා ගැනීම;

(ද) පීඩාවට පත් තැනැත්තන් වෙත ප්‍රදානය කිරීම සඳහා වන හානිපූරණයන් සම්බන්ධයෙන් සිදුකරන ලද නිර්දේශයන් පිළිබඳ සියලු තොරතුරු ඇතුළත් වන දත්ත සමුදායක් නිර්මාණය කිරීම, කළමනාකරණය කිරීම සහ පවත්වාගෙන යෑම. පූර්වයෙන් වෙන යම් රාජ්‍ය අධිකාරයක් හෝ නියෝජ්‍යායතනයක් විසින් ප්‍රදානය කරන ලද හානිපූරණයන් පිළිබඳ විස්තර ද එකී දත්ත සමුදායට ඇතුළත් විය යුතු ය;

(න) කලින් කල හානිපූරණ සඳහා කරන ලද ඉල්ලීම්වල තත්ත්වය පිළිබඳව පීඩාවට පත් තැනැත්තන් හෝ එකී පීඩාවට පත් තැනැත්තන්ගේ නියෝජිතයන් දැනුවත් කිරීම සහ එම ඉල්ලීම්වල ප්‍රගතියට අදාළ විමසීම්වලට කාලෝචිත ආකාරයකින් ප්‍රතිචාර දැක්වීම;

(ප) හානිපූරණය සඳහා වන කාර්යාලය මගින් පීඩාවට පත් තැනැත්තන්ට හානිපූරණයන් සැපයීම සඳහා යොදාගත යුතු සහ මේ කාර්යාලයේ ක්‍රියාත්මකභාවය පත් කිරීම සඳහා යොදාගනු ලබන අරමුදල් කළමනාකරණය කිරීම;

(බ) එහි බලතල ක්‍රියාත්මක කිරීම සඳහා සහ එහි කර්තව්‍ය ඉටුකිරීම සඳහා හෝ එහි අරමුණු සාක්ෂාත් කර ගැනීමට අවශ්‍ය වෙනත් සියලු දේ කිරීම.

හානිපූරණය සඳහා වන ප්‍රතිපත්ති සකස් කිරීම.

**12.** (1) හානිපූරණ ප්‍රතිපත්ති සකස් කිරීමේ දී සහ මාර්ගෝපදේශ නිකුත් කිරීමේ දී හානිපූරණ සඳහා වන කාර්යාලය-

(අ) යෝග්‍ය ක්‍රම මගින්, පීඩාවට පත් තැනැත්තන්, පීඩාවට පත් තැනැත්තන්ගේ ඥාතීන් නියෝජනය කරන සංවිධාන සහ වෙනත් යම් අධිකාරයන්, තැනැත්තන් හෝ පුද්ගල මණ්ඩල විමසීම;

(ආ) ස්ත්‍රී පුරුෂ භාවය පිළිබඳ ප්‍රතිචාර්යතාවට සහ ස්ත්‍රීන්, ළමයින් සහ ආබාධ සහිත තැනැත්තන් වන පීඩාවට පත් තැනැත්තනගේ විශේෂිත අවශ්‍යතාවයන් සම්බන්ධව හානිපූරණ සඳහා වන කාර්යාලයට උපදෙස් ලබාදීම සඳහා අදාළ විශේෂඥතාව සහිත උපදේශකයන් සෑම අවස්ථාවක දී ම සිටින බවට වගබලා ගැනීම;

(ඇ) වෙනස්කම්වලට පාත්‍ර නොකිරීම, වින්දිත-කේන්ද්‍රීයතාව සහ සාධාරණත්වය මගින් සහ ස්ත්‍රීන්, ළමයින් සහ ආබාධ සහිත තැනැත්තන් කෙරෙහි නිසි සැලකිල්ලක් සහිත බව මගින් මෙහෙයවනු ලැබීම;

(ඈ) (i) පීඩාවට පත් තැනැත්තාගේ අයිතිවාසිකම් උල්ලංඝනය වීමේ බරපතළකම;

(ii) අඛණ්ඩ ශාරීරික, මානසික සහ ආර්ථිකමය බලපෑම ඇතුළුව, එවැනි උල්ලංඝනය වීමක් මගින් පීඩාවට පත් තැනැත්තන් මත ඇති වන බලපෑම;

(iii) ස්ත්‍රීන්, ළමයින් සහ ආබාධ සහිත තැනැත්තන් ඇතුළුව අනාරක්ෂිත පීඩාවට පත් තැනැත්තන් සඳහා විශේෂ පියවර සලසාදීමේ අවශ්‍යතාවය;

(iv) ප්‍රශ්නගත අයිතිවාසිකම් උල්ලංඝනය වීමට අදාළව පීඩාවට පත් තැනැත්තන් විසින් දැනටමත් ලබා ඇති හානිපූරණ සඳහා හේතු දැක්වීමේ අවශ්‍යතාවය;

(v) මූල්‍යමය හානිපූරණ ප්‍රදානය කිරීමේ දී, සම්පත්වල සුලභතාවය ඇතුළත්ව සම්පූර්ණ මුදල් එකවර ගෙවීම සහ අසමාන කොටස් වශයෙන් ගෙවීම ඇතුළු ගෙවීම් ආකාර අතරින් ගෙවීම් සිදු කළ යුතු ආකාරය තීරණය කිරීමේ දී පීඩාවට පත් තැනැත්තන්ගේ යහපත ඇතුළු සාධක සලකා බැලීම;

(vi) මූල්‍ය නොවන හානිපූරණවල යෝග්‍යභාවය;

(vii) මූල්‍යමය වන තනි හානිපූරණ ප්‍රදානය කිරීමේ දී වඩාත් බරපතළ සන්තාපයක් සහිත පීඩාවට පත් තැනැත්තන් වෙනුවෙන් එම හානිපූරණ ලබා දීම සීමා කිරීමේ අවශ්‍යතාවය;

(viii) පීඩාවට පත් තැනැත්තාගේ අයිතිවාසිකම් උල්ලංඝනය වීමේ බරපතළකම, පීඩාවට පත් තැනැත්තන්ගේ දිළිඳු බව සහ සම්පත්වල

සුලභතාවය සලකා බලමින් මූල්‍යමය හානිපූරණ ලබාදීමට ප්‍රමුඛතාවය ලබාදීමේ අවශ්‍යතාවය;

(ix) මිය ගිය හෝ අතුරුදහන් වී ඇති තැනැත්තකු සම්බන්ධව ඥාතීන් බොහෝ ප්‍රමාණයක් හිමිකම් ප්‍රකාශ කර සිටින අවස්ථාවක දී බෙදාහැරීමේ ක්‍රමානුකූල සැලැස්මක් සකස් කිරීමේ අවශ්‍යතාවය,

ඇතුළු සියලු අදාළ සාධක පිළිබඳ නිසි සැළකිල්ලක් දැක්වීම;

(ඉ) සාමූහික හානිපූරණවල දී-

(i) වෙනස්කම්වලට පාත්‍ර නොකිරීම, ප්‍රතිසන්ධාන පහසුකම් සැලැස්වීම, සහ සියලු පීඩාවට පත් තැනැත්තන්ගේ අත්දැකීම්වලට සංවේදී වීමේ හැකියාව;

(ii) අදාළ පීඩාවට පත් තැනැත්තන්, එකී පීඩාවට පත් තැනැත්තන් නියෝජනය කරන සංවිධාන සහ වෙනත් යම් අධිකාරයක්, තැනැත්තකු හෝ පුද්ගල මණ්ඩලයක් විමසීම මගින් එවැනි හානිපූරණවල ආකාරය දැනුම් දෙනු ලැබිය යුතු බව,

තහවුරු කිරීමේ අවශ්‍යතාවය පිළිබඳ සැලකිලිමත් වීම,

කළ යුතු ය.

(2) සැක දුරුකිරීමේ කාර්යය සඳහා හානිපූරණ ලැබීම, යම් පීඩාවට පත් තැනැත්තන්ගේ අයිතිවාසිකම් උල්ලංඝනය කරනු ලැබ තිබිය හැකි යම් තැනැත්තකුට එරෙහිව, එම පීඩාවට පත් තැනැත්තන්ට නීතියෙන් හිමි යම් පිළියමක් ක්‍රියාවේ යෙදවීමෙන් ඔවුන් වැළැක්වීම, නොකළ යුතු බවට නිශ්චිතවම විධිවිධාන සලස්වනු ලැබ ඇත.

(3) හානිපූරණය සඳහා වන කාර්යාලයේ විහිදුම් ඒකකය මගින් වෙනත් යම් සුදුසු අධිකාරයක්, තැනැත්තකු හෝ පුද්ගල මණ්ඩලයක් ඉදිරියේ යම් පීඩාවටපත් තැනැත්තන්ට පෙනී සිටීමට ඇති හැකියාව පිළිබඳව දැනුවත් කරනු ලැබිය යුතු ය.

(4) ඕ.එම්.පී. සහ වෙනත් අදාළ ආයතන ඉදිරියේ පෙනී සිට ඇති පීඩාවට පත් තැනැත්තන් සම්බන්ධයෙන් තොරතුරු ලබා ගැනීමේ දී, හානිපූරණය සඳහා වන කාර්යාලය විසින්, එකී පීඩාවට පත් තැනැත්තන් විසින් හානිපූරණය සඳහා වන කාර්යාලයට ඉල්ලීමක් ඉදිරිපත් කරනු ලැබ ඇත් ද යන්න නොසලකමින්, ඕ.එම්.පී. සහ වෙනත් ආයතන සමග සම්බන්ධීකරණය කරනු ලැබිය යුතු ය.

**රහස්‍යභාවය.**

**13.** (1) වෙනත් යම් ලිඛිත නීතියක පටහැනිව කුමක් සඳහන් වුව ද, මේ පනත යටතේ බලතල සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ දී සහ ඉටුකිරීමේ දී හැර, හානිපූරණය සඳහා වන කාර්යාලය සඳහා පත් කරනු ලැබූ සෑම සාමාජිකයකු, නිලධරයකු සහ සේවකයකු විසින්ම ඔවුන්ට රහසිගතව සන්නිවේදනය කරන ලද කාරණා සම්බන්ධයෙන්, එම තොරතුරු සපයනු ලබන තැනැත්තා විසින් එහි රහස්‍යභාවය පිළිබඳ අවශ්‍යතාවය අත්හැර දමනු ලබන තාක් දුරට හැර, එහි රහස්‍යභාවය ආරක්ෂා කරනු ලැබිය යුතු අතර රහස්‍යභාවය ආරක්ෂා කිරීමේ දී ඊට සහාය ලබා දිය යුතු ය.

(2) එහි සියලු දත්ත සමුදායන් සහ දත්තවල ආරක්ෂාව තහවුරු කිරීම සඳහා හානිපූරණ සඳහා වන කාර්යාලය විසින් තාක්ෂණික ආරක්ෂාව සැපයීම ඇතුළු අවශ්‍ය සියලු පියවරයන් ගනු ලැබිය යුතු ය.

## III වන කොටස

### ලේකම් කාර්යාලය

**ලේකම් කාර්යාලය.**

**14.** (1) හානිපූරණය සඳහා වන කාර්යාලයට ලේකම් කාර්යාලයක් තිබිය යුතු අතර, එම ලේකම් කාර්යාලය හානිපූරණය සඳහා වන කාර්යාලයේ කටයුතු පරිපාලනය කිරීම සම්බන්ධ වගකීම භාරව සිටිය යුතු ය.

(2) හානිපූරණය සඳහා වන කාර්යාලය විසින්, කාර්යාලයේ ප්‍රධාන විධායක නිලධරයා විය යුතු අධ්‍යක්ෂ ජනරාල්වරයකු පත් කරනු ලැබිය යුතු ය.

(3) හානිපූරණය සඳහා වන කාර්යාලයේ බලතල සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ දී සහ ඉටු කිරීමේ දී හානිපූරණය සඳහා වන කාර්යාලයට සහාය වීම සඳහා අවශ්‍ය විය හැකි වෙනත් යම් නිලධරයන් සහ සේවකයන්, හානිපූරණය සඳහා වන කාර්යාලය විසින් පත් කරනු ලැබිය හැකි ය.

හානිපූරණය සඳහා වන කාර්යාලය සඳහා රාජ්‍ය නිලධරයන් පත් කිරීම.

**15.** (1) හානිපූරණය සඳහා වන කාර්යාලයේ ඉල්ලීම මත රාජ්‍ය සේවයේ යම් නිලධරයකු, ඒ නිලධරයාගේ සහ රාජ්‍ය පරිපාලන විෂයය පවරා ඇති අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ කැමැත්ත ඇතිව හානිපූරණය සඳහා වන කාර්යාලය විසින් නිශ්චය කරනු ලැබිය හැකි යම් කාලසීමාවක් සඳහා කොමිෂන් සභාවට තාවකාලිකව පත් කරනු ලැබිය හැකි ය. නැතහොත් එම කැමැත්ත ඇතිව ඒ කාර්ය මණ්ඩලයට ස්ථිරවම පත් කරනු ලැබිය හැකි ය.

(2) රාජ්‍ය සේවයේ යම් නිලධරයකු හානිපූරණය සඳහා වන කාර්යාලයේ කාර්ය මණ්ඩලයට තාවකාලිකව පත් කරනු ලබන අවස්ථාවක දී 1991 අංක 37 දරන ජාතික ගමනාගමන කොමිෂන් සභා පනතේ 14 වන වගන්තියේ (2) වන උපවගන්තියේ විධිවිධාන අවශ්‍ය වෙනස් කිරීම් සහිතව ඒ නිලධරයාට සහ ඒ නිලධරයා සම්බන්ධයෙන් අදාළ කර ගනු ලැබිය යුතු ය.

(3) රාජ්‍ය සේවයේ යම් නිලධරයකු හානිපූරණය සඳහා වන කාර්යාලයේ කාර්ය මණ්ඩලයට ස්ථිරව පත් කරනු ලබන අවස්ථාවක දී 1991 අංක 37 දරන ජාතික ගමනාගමන කොමිෂන් සභා පනතේ 14 වන වගන්තියේ (3) වන උපවගන්තියේ විධිවිධාන අවශ්‍ය වෙනස් කිරීම් සහිතව ඒ නිලධරයාට සහ ඒ නිලධරයා සම්බන්ධයෙන් අදාළ කරගනු ලැබිය යුතු ය.

## IV වන කොටස

### මුදල් හා වාර්තා කිරීම

හානිපූරණය සඳහා වන කාර්යාලයේ අරමුදල.

**16.** (1) හානිපූරණය සඳහා වන කාර්යාලය සඳහා අරමුදලක් තිබිය යුතු ය. හානිපූරණය සඳහා වන කාර්යාලයේ අරමුදලට පහත දැ බැර කරනු ලැබිය යුතු යः-

(අ) 1987 අංක 29 දරන තැනැත්තන්, දේපළ සහ කර්මාන්ත පුනරුත්ථාපනය කිරීමේ අධිකාරිය පනත ප්‍රකාරව තැනැත්තන්, දේපළ සහ කර්මාන්ත පුනරුත්ථාපනය කිරීමේ අධිකාරිය වෙත ඉදිරිපත් කරන ලද ඉල්ලීම්වලට අදාළව මේ පනත ආරම්භ වන දිනයේ දී තැනැත්තන්, දේපළ සහ කර්මාන්ත පුනරුත්ථාපනය කිරීමේ අධිකාරියේ බැරට ඇති සියලු ශේෂ;

(ආ) මේ පනතේ කාර්ය සඳහා කලින් කල පාර්ලිමේන්තුව විසින් සම්මත කරනු ලබන සියලු මුදල් ප්‍රමාණයන්;

(ඇ) ශ්‍රී ලංකාව තුළ හෝ ඉන් බැහැරව පරිත්‍යාග, ප්‍රදාන හෝ තෑගි වශයෙන් හානිපූරණය සඳහා වන කාර්යාලයට ලැබෙන සියලු මුදල්:

එසේ වුව ද, සියලු විදේශ අරමුදල් විදේශ සම්පත් දෙපාර්තමේන්තුව හරහා ලබාගත යුතු ය.

(2) මේ පනත පරිපාලනය කිරීමේ දී සහ ක්‍රියාත්මක කිරීමේ දී දරන ලද යම් වියදමක් පියවීම සඳහා අවශ්‍ය සියලු මුදල් සහ මේ පනතේ යම් විධිවිධානයක් මගින් හෝ යම් විධිවිධානයක් යටතේ ගෙවීමට අවශ්‍ය සියලු මුදල් අරමුදලින් ගෙවනු ලැබිය යුතු ය.

හානිපූරණය සඳහා වන කාර්යාලයේ සාමාජිකයන්ගේ වැටුප්.

**17.** හානිපූරණය සඳහා වන කාර්යාලයේ සාමාජිකයන්ගේ වැටුප් පාර්ලිමේන්තුව විසින් නිශ්චය කරනු ලැබ ඒකාබද්ධ අරමුදලින් ගෙවනු ලැබිය යුතු අතර ඔවුන්ගේ ධුර කාලයන් තුළ අඩු කරනු නොලැබිය යුතු ය.

මුදල් වර්ෂය.

**18.** (1) හානිපූරණය සඳහා වන කාර්යාලයේ මුදල් වර්ෂය ලිත් වර්ෂය විය යුතු ය.

(2) සිය ආදායම සහ වියදම් සහ වත්කම් සහ බැරකම් සම්බන්ධයෙන් නිසි ගිණුම් තබා ගැනීමට හානිපූරණය සඳහා වන කාර්යාලය විසින් කටයුතු සැලැස්විය යුතු ය.

(3) හානිපූරණය සඳහා වන කාර්යාලයේ ගිණුම් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 වන ව්‍යවස්ථාව ප්‍රකාරව විගණකාධිපතිවරයා විසින් විගණනය කරනු ලැබිය යුතු ය.

වාර්තා කිරීම.

**19.** හානිපූරණය සඳහා වන කාර්යාලය විසින් සිය විගණනය කරන ලද ගිණුම් ඇතුළු වාර්ෂික වාර්තා පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු අතර එකී වාර්තා පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීමෙන් මාසයක් තුළ එම වාර්තා ප්‍රසිද්ධියට පත් කිරීමට ද කටයුතු සැලැස්විය යුතු ය.

V වන කොටස

**සාමාන්‍ය විධිවිධාන**

වැරදි.

**20.** (1) යම් තැනැත්තකු -

(අ) මේ පනතේ බලය පවරනු ලැබූ යම් නිලධරයකුට තමා වෙත පවරනු ලැබූ බලතල ක්‍රියාත්මක කිරීමේ දී ප්‍රතිරෝධය පාන්නේ නම් හෝ බාධා කරන්නේ නම්; හෝ

(ආ) සිය බලතල සහ කර්තව්‍ය ඉටු කිරීමේ දී හෝ ක්‍රියාත්මක කිරීමේ දී හානිපූරණය සඳහා වන කාර්යාලයට අයුතු ලෙස බාධා කරන්නේ නම් හෝ අවහිර කරන්නේ නම්; හෝ

(ඇ) හානිපූරණය සඳහා වන කාර්යාලයට හිතාමතා අසත්‍ය තොරතුරු ලබා දෙන්නේ නම්; හෝ

(ඈ) මේ පනතේ විධිවිධාන උල්ලංඝනය කරමින් යම් රහස්‍ය තොරතුරු හෙළි කරන්නේ නම්,

එකී තැනැත්තා හානිපූරණය සඳහා වන කාර්යාලයේ අධිකාරි බලයට විරුද්ධව අපහාස කිරීමේ වරදට වරදකරු විය යුතු ය.

(2) යම් තැනැත්තකු විසින් හානිපූරණය සඳහා වන කාර්යාලයේ අධිකාරි බලයට විරුද්ධව අපහාස කිරීමේ වරද සිදු කර ඇති බවට විශ්වාස කිරීම සාධාරණ හේතු හානිපූරණය සඳහා වන කාර්යාලය සතු වන විට දී, හානිපූරණය සඳහා වන කාර්යාලය විසින් එකී කරුණ අභියාචනාධිකරණයට වාර්තා කළ යුතු ය. හානිපූරණය සඳහා වන කාර්යාලයේ අධිකාරි බලයට විරුද්ධව සිදු කරන ලද සෑම අපහාස කිරීමේ වරදක්ම අභියාචනාධිකරණයට විරුද්ධව සිදුකරන ලද අපහාස කිරීමේ වරදක් මෙන් සලකා අභියාචනාධිකරණය විසින් ඒ සඳහා දඬුවම් පැමිණ විය යුතු ය.

නඩුවලින් ආරක්ෂා වීම.

**21.** (1) මේ පනතේ 25 වන වගන්තියේ විධිවිධාන සලසා ඇති පරිදි හැර, හානිපූරණය සඳහා වන කාර්යාලයේ යම් සාමාජිකයකු, නිලධරයකු හෝ සේවකයකු විසින් මේ පනත යටතේ සද්භාවයෙන් කරන ලද හෝ කරන ලදැයි හෝ සිදු කරන ලදැයි කියනු ලබන යම් ක්‍රියාවක් සම්බන්ධයෙන් එම සාමාජිකයාට, නිලධරයාට හෝ

සේවකයාට විරුද්ධව කිසිම අපරාධ නඩු කටයුත්තක් පවරනු හෝ පවත්වාගෙන යනු නොලැබිය යුතු ය.

(2) හානිපූරණය සඳහා වන කාර්යාලයේ හෝ එහි යම් සාමාජිකයකුගේ, නිලධරයකුගේ හෝ සේවකයකුගේ යම් නියමයක්, තීරණයක්, ක්‍රියාවක් හෝ නොකර හැරීමක් සම්බන්ධයෙන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 126 වන ව්‍යවස්ථාව හෝ 140 වන ව්‍යවස්ථාව යටතේ වන නීති කෘත්‍යයක දී ප්‍රශ්න කරනු ලැබිය හැකි ය.

(3) (2) වන උපවගන්තියේ විධිවිධානවලට යටත්ව, හානිපූරණය සඳහා වන කාර්යාලයේ යම් සාමාජිකයකු, නිලධරයකු හෝ සේවකයකු විසින් මේ පනත යටතේ සද්භාවයෙන් කරන ලද හෝ සද්භාවයෙන් කරන ලදැයි හෝ සිදුකරන ලදැයි කියනු ලබන යම් ක්‍රියාවක් සම්බන්ධයෙන් එම සාමාජිකයාට, නිලධරයාට හෝ සේවකයාට විරුද්ධව කිසිම සිවිල් නඩු කටයුත්තක් පවරනු හෝ පවත්වාගෙන යනු නොලැබිය යුතු ය.

(4) මේ පනත යටතේ (1) වන, (2) වන හෝ (3) වන උපවගන්තිවල සඳහන් හානිපූරණය සඳහා වන කාර්යාලයට පත් කරන ලද යම් සාමාජිකයකු, නිලධරයකු හෝ සේවකයකු විසින් කරන ලද හෝ කරන ලදැයි කියනු ලබන හෝ නොකර හරින ලද යම් ක්‍රියාවක් සම්බන්ධයෙන් ඒ තැනැත්තාට විරුද්ධව යම් අධිකරණයක පවරන ලද යම් සිවිල් හෝ අපරාධ නඩුවක දී ඒ තැනැත්තා විසින් දරන ලද යම් වියදමක් ඒ වියදම ඔහු විසින් එම නඩුවේ දී අයකරගෙන ඇත්තේ නම් මිස, හා ඒ ක්‍රියාව සද්භාවයෙන් කරන ලද හෝ නොකර හරින ලද බවට අධිකරණය විසින් තීරණය කරතොත් අරමුදලින් ගෙවනු ලැබිය යුතු ය.

**22.** (1) හානිපූරණය සඳහා වන කාර්යාලය විසින් රීති සෑදීමට අවශ්‍ය යම් කරුණු සම්බන්ධයෙන් රීති සාදනු ලැබිය හැකි ය. රීති.

(2) මේ පනත යටතේ සාදනු ලබන සෑම රීතියක්ම පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරනු ලැබිය යුතු අතර, මාස තුනක් නොඉක්මවන්නා වූ සාධාරණ කාලසීමාවක් තුළ දී ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතු ය.

(3) අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරනු ලැබූ හානිපූරණ ප්‍රතිපත්ති සහ මාර්ගෝපදේශ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරනු ලැබිය

යුතු අතර, මාස තුනක් නොඉක්මවන්නා වූ සාධාරණ කාලසීමාවක් තුළ දී *ගැසට් පත්‍රයේ* පළ කරනු ලැබිය යුතු ය.

(4) මේ පනතේ විධිවිධානවල කෙසේ සඳහන් වුව ද, අරමුදල් බෙදාහැරීමට බලය දෙනු ලබන හානිපූරණ ප්‍රතිපත්ති සහ මාර්ගෝපදේශ අනුමතය සඳහා පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු අතර මාස තුනක් නොඉක්මවන්නා වූ සාධාරණ කාලසීමාවක් තුළ දී *ගැසට් පත්‍රයේ* පළ කරනු ලැබිය යුතු අතර එකී හානිපූරණ ප්‍රතිපත්ති හෝ මාර්ගෝපදේශ ප්‍රකාර යම් අරමුදල් බෙදා හැරීම එකී අනුමතයට පසු පමණක් බලාත්මක විය යුතු ය.

සාමාජිකයන් ආදිය රජයේ සේවකයන් ලෙස සලකනු ලැබිය යුතු බව.

**23.** (1) හානිපූරණය සඳහා වන කාර්යාලයේ සාමාජිකයන් (මේ පනත යටතේ සිය කර්තව්‍ය ඉටු කිරීමේ සීමිත කාර්ය සඳහා) සහ එහි නිලධරයන් සහ සේවකයන් (19 වන අධිකාරය වූ) දණ්ඩ නීති සංග්‍රහයේ, (26 වන අධිකාරය වූ) අල්ලස් පනතේ සහ (14 වන අධිකාරය වූ) සාක්ෂි ආඥාපනතේ කාර්ය සඳහා රජයේ සේවකයන් ලෙස සලකනු ලැබිය යුතු ය.

(2) හානිපූරණය සඳහා වන කාර්යාලය (26 වන අධිකාරය වූ) අල්ලස් පනතේ අර්ථානුකූලව උපලේඛනගත ආයතනයක් ලෙස සලකනු ලැබිය යුතු අතර, ඒ පනතේ විධිවිධාන ඒ අනුව තේරුම්ගත යුතු ය.

බලතල පැවරීම.

**24.** (1) හානිපූරණය සඳහා වන කාර්යාල විසින් එහි බලතල සහ කර්තව්‍ය කිසිවක් එහි ප්‍රධාන විධායක නිලධරයා හෝ වෙනත් යම් සාමාජිකයකු හෝ නිලධරයකු වෙත පවරනු ලැබිය හැකි ය.

(2) හානිපූරණය සඳහා වන කාර්යාලයේ බලතල හෝ කර්තව්‍ය කිසිවක් පවරනු ලැබ ඇති ප්‍රධාන විධායක නිලධරයා, සාමාජිකයා හෝ බලධරයා විසින් හානිපූරණය සඳහා වන කාර්යාලයේ සාමාන්‍ය හෝ විශේෂ විධානයන්ට යටත්ව එකී බලතල සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම සහ ඉටුකිරීම කළ යුතු ය.

වෙනත් යම් තැනැත්තකුගේ සිවිල් හෝ අපරාධ වගකීමක් නොවන බව.

**25.** යම් පීඩාවට පත් තැනැත්තන් හෝ එකී පීඩාවට පත් තැනැත්තන්ගේ නියෝජිතයන්ගේ යම් ඉල්ලීමක් භාර ගැනීම හෝ ඔවුන්ට හානිපූරණ ප්‍රදානය කිරීම වෙනත් යම් තැනැත්තකු වෙත සිවිල් හෝ අපරාධ වගකීමක් වීමට හේතු නොවිය යුතු ය.

ඉවත් කිරීම්, ඉතිරි කිරීම් සහ අන්තර් කාලීන විධිවිධාන.

**26.** (1) (මේ පනතේ "ඉවත් කරනු ලැබූ පනත" යනුවෙන් හඳුන්වනු ලබන) 1987 අංක 29 දරන තැනැත්තන්, දේපළ සහ කර්මාන්ත පුනරුත්ථාපනය කිරීමේ අධිකාරිය පනත මෙයින් ඉවත් කරනු ලැබේ.

(2) ඉහත කී පනත ඉවත් කරනු ලැබූව ද -

(අ) මේ පනත ආරම්භක දිනයේ දී පවතින්නා වූ ඉවත් කරනු ලැබූ පනතේ 2 වන වගන්තිය යටතේ පිහිටුවනු ලැබූ තැනැත්තන්, දේපළ සහ කර්මාන්ත පුනරුත්ථාපනය කිරීමේ අධිකාරියේ ලිපිගොනු, වාර්තා, ලේඛනගත කිරීම්, පරිගණක, දත්ත ගබඩා කිරීමේ උපක්‍රම ඇතුළු සියලු චංචල සහ නිශ්චල දේපළ, මේ පනත බලාත්මක වන දිනයේ සිට මේ පනතේ 3 වන වගන්තිය යටතේ පිහිටුවනු ලැබූ හානිපූරණය සඳහා වන කාර්යාලය සතු විය යුතු ය;

(ආ) මේ පනත ආරම්භක දිනයේ දී පවතින්නා වූ ඉවත් කරනු ලැබූ පනතේ 2 වන වගන්තිය යටතේ පිහිටුවනු ලැබූ තැනැත්තන්, දේපළ සහ කර්මාන්ත පුනරුත්ථාපනය කිරීමේ අධිකාරිය විසින් හෝ අධිකාරිය සමඟ එළඹුණු සියලු ගිවිසුම් සහ එකඟතා මේ පනත බලාත්මක වන දිනයේ සිට මේ පනතේ 3 වන වගන්තිය යටතේ පිහිටුවනු ලැබූ හානිපූරණය සඳහා වන කාර්යාලය විසින් හෝ සමඟ එළඹුණු ගිවිසුම් සහ එකඟතා විය යුතු ය;

(ඇ) (i) මේ පනතේ 3 වන වගන්තිය යටතේ පිහිටුවනු ලැබූ හානිපූරණය සඳහා වන කාර්යාලයේ සේවා නියුක්තිය පිරිනමනු ලැබූ සහ එම සේවා නියුක්තිය භාර ගැනීමට කැමැත්ත පළ කරනු ලැබූ ඉවත් කරනු ලැබූ පනතේ 2 වන වගන්තිය යටතේ පිහිටුවනු ලැබූ තැනැත්තන්, දේපළ සහ කර්මාන්ත පුනරුත්ථාපනය කිරීමේ අධිකාරියේ සියලු නිලධරයන් හෝ සේවකයන්, තැනැත්තන්, දේපළ සහ කර්මාන්ත පුනරුත්ථාපනය කිරීමේ අධිකාරියේ ඔවුන්ගේ සේවා නියමයන්ට වඩා වාසිදායක බවින් අඩු නොවන නියම මත මේ පනතේ 3 වන වගන්තිය යටතේ පිහිටුවනු ලැබූ හානිපූරණය සඳහා වන කාර්යාලයේ කාර්ය මණ්ඩලයේ සාමාජිකයන් විය යුතු ය;

(ii) ඉවත් කරන ලද පනතේ 2 වන වගන්තිය යටතේ පිහිටුවනු ලැබූ තැනැත්තන්, දේපළ සහ කර්මාන්ත පුනරුත්ථාපනය කිරීමේ අධිකාරියේ යම් නිලධරයකු හෝ සේවකයකු -

(අඅ) හානිපූරණය සඳහා වන කාර්යාලයේ සේවා නියුක්තිය පිළි නොගැනීම සඳහා වන සිය කැමැත්ත පළ කළ අවස්ථාවක; හෝ

(ආආ) හානිපූරණය සඳහා වන කාර්යාලයේ සේවා නියුක්තිය පිළිගැනීමට කැමැත්ත පළ කළ ද, තැනැත්තන්, දේපළ සහ කර්මාන්ත පුනරුත්ථාපනය කිරීමේ අධිකාරියේ ඔහු විසින් ඉටු කරන ලද සේවයේ ස්වභාවය හේතුකොටගෙන හානිපූරණය සඳහා වන කාර්යාලයේ කාර්ය මණ්ඩලයට ඔහු ප්‍රතියෝජනය කිරීමට නොහැකි වන අවස්ථාවක,

අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරනු ලැබූ ස්වේච්ඡාවෙන් විශ්‍රාම ගැනීමේ යෝජනා ක්‍රමයක් ප්‍රකාරව වන්දි ලබා දෙනු ලැබිය යුතු ය;

(iii) හානිපූරණය සඳහා වන කාර්යාලයේ සේවක මණ්ඩලය සහ වැටුප් පිළිබඳ ව අදාළ අධිකාරය විසින් සුදුසු තීරණයක් ගනු ලබන තෙක්, මේ පනත ආරම්භක දිනයට පෙරාතුව ම වූ දිනයේ දී තැනැත්තන්, දේපළ සහ කර්මාන්ත පුනරුත්ථාපනය කිරීමේ අධිකාරියේ කාර්ය මණ්ඩලය සහ වැටුප් සම්බන්ධයෙන් කරනු ලැබූ සහ බලපැවැත්වෙන අනුමත කිරීම් හානිපූරණය සඳහා වන කාර්යාලයේ කාර්ය මණ්ඩලය සහ වැටුප් සම්බන්ධව වන අනුමත කිරීම් වශයෙන් සලකනු ලැබිය යුතු ය;

(ඇ) මේ පනතේ ආරම්භක දිනය වන විට අවසන් නොවී පවතින ඉවත් කරන ලද පනතේ 2 වන වගන්තිය යටතේ පිහිටුවනු ලැබූ තැනැත්තන්, දේපළ සහ කර්මාන්ත පුනරුත්ථාපනය කිරීමේ අධිකාරිය විසින් ආරම්භ කරන ලද හෝ තැනැත්තන්, දේපළ සහ කර්මාන්ත

පුනරුත්ථාපනය කිරීමේ අධිකාරියට, එරෙහිව ගොනු කරන ලද සියලු නඩු සහ නීති කෘත්‍යයන් මේ පනත ආරම්භක දිනයේ සිට අවස්ථාවෝචිත පරිදි, මේ පනතේ 3 වන වගන්තිය යටතේ පිහිටුවනු ලැබූ හානිපූරණය සඳහා වන කාර්යාලය විසින් හෝ හානිපූරණය සඳහා වන කාර්යාලයට එරෙහිව ගොනු කරන ලද නඩු සහ නීති කෘත්‍යයන් ලෙස සලකනු ලැබිය යුතු ය;

(ඉ) මේ පනතේ ආරම්භක දිනයට පෙරාතුවම වූ දිනයේ දී ඉවත් කරන ලද පනතේ 2 වන වගන්තිය යටතේ පිහිටුවනු ලැබූ තැනැත්තන්, දේපළ සහ කර්මාන්ත පුනරුත්ථාපනය කිරීමේ අධිකාරියේ වාසියට හෝ ඊට එරෙහිව ඉටු නොකර ඉතිරිව ඇති සෑම නඩු තීන්දුවක් හෝ ආඥාවක් ම මේ පනත ආරම්භක වන දිනයේ සිට මේ පනතේ 3 වන වගන්තිය යටතේ පිහිටුවනු ලැබූ හානිපූරණය සඳහා වන කාර්යාලයේ වාසියට හෝ ඊට එරෙහිව ඇතුළත් කරන ලද නඩු තීන්දුවක් හෝ ආඥාවක් ලෙස සලකනු ලැබිය යුතු අතර, ඒ අනුව බලාත්මක කළ යුතු ය;

(ඊ) මේ පනතේ ආරම්භක දිනයට පෙරාතුව ම වූ දිනයේ දී ඉවත් කරන ලද පනතේ 2 වන වගන්තිය යටතේ පිහිටුවනු ලැබූ තැනැත්තන්, දේපළ සහ කර්මාන්ත පුනරුත්ථාපනය කිරීමේ අධිකාරිය වෙත කරනු ලැබූ සියලු ඉල්ලීම් සහ එම අධිකාරිය විසින් ආරම්භ කරනු ලැබූ සියලු වැඩසටහන් මේ පනත ක්‍රියාත්මක වන දිනයේ සිට සහ ඊට පසු මේ පනතේ 3 වන වගන්තිය යටතේ පිහිටුවනු ලැබූ හානිපූරණය සඳහා වන කාර්යාලය වෙත කරනු ලැබූ ඉල්ලීම් සහ එම කාර්යාලය විසින් ආරම්භ කරනු ලැබූ වැඩසටහන් ලෙස සලකනු ලැබිය යුතු ය; සහ

(උ) මේ පනතේ ආරම්භක දිනයට පෙරාතුව ම වූ දිනයේ දී ඉවත් කරන ලද පනතේ 2 වන වගන්තිය යටතේ පිහිටුවනු ලැබූ තැනැත්තන්, දේපළ සහ කර්මාන්ත පුනරුත්ථාපනය කිරීමේ අධිකාරියේ සියලු අයිතීන්, අයිතිවාසිකම්, වත්කම්, බැඳීම්, ණය සහ වගකීම් මේ පනතේ ආරම්භක දිනයේ සිට සහ ඊට පසු මේ පනතේ 3 වන වගන්තිය යටතේ පිහිටුවනු ලැබූ හානිපූරණය සඳහා වන කාර්යාලයේ අයිතීන්, අයිතිවාසිකම්, වත්කම්, බැඳීම්, ණය සහ වගකීම් විය යුතු ය.

අර්ථ නිරූපණය.

**27.** පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස, මේ පනතෙහි,-

"පීඩාවට පත් තැනැත්තන්" යන්නෙන්-

(අ) (i) උතුරු සහ නැගෙනහිර පළාත්වල සිදු වූ සන්නද්ධ ගැටුම් අතරතුර එහි ප්‍රතිඵලයක් වශයෙන්, හෝ ඊට සම්බන්ධව හෝ එහි පසුවිපාකයක් ලෙස; හෝ

(ii) දේශපාලන නොසන්සුන්තාවයක් හෝ සිවිල් කැළඹීම් සම්බන්ධයෙන්; හෝ

(iii) ශ්‍රී ලංකාවේ පුද්ගල, කණ්ඩායම් හෝ ජන කොට්ඨාසවල අයිතිවාසිකම් පද්ධතිමය වශයෙන් දැඩි ලෙස උල්ලංඝනය වන අතරතුර දී; හෝ

(iv) 2018 අංක 5 දරන, බලහත්කාරයෙන් අතුරුදහන් කිරීම් වලින් සියලු තැනැත්තන් ආරක්ෂා කිරීම සඳහා වූ ජාත්‍යන්තර සම්මුති පනතේ නිර්වචනය කර ඇති පරිදි වූ බලහත්කාරයෙන් අතුරුදහන් වීමක් හේතුවෙන්,

අදාළ වන පරිදි, (1949 පළමුවන, දෙවන, තුන්වන හෝ හතරවන ජිනීවා ප්‍රඥප්තියේ ඇතුළත් වන පරිදි) මානුෂීය නීති හෝ මානව අයිතිවාසිකම් උල්ලංඝනය කිරීමකින් පීඩාවට පත් තැනැත්තන්;

(ආ) (අ) ඡේදයේ අවස්ථානුගත කරුණුවල සඳහන් මියගිය තැනැත්තකුගේ හෝ අතුරුදහන් වූ තැනැත්තකුගේ ඥාතීන්,

අදහස් වේ;

"සාමූහික හානිපූරණ" යන්නෙන්, පීඩාවට පත් තැනැත්තන් කණ්ඩායම් හෝ කොට්ඨාස සඳහා ඵලදායී ප්‍රතිකර්ම සහ ප්‍රතිලාභ සඳහා වන අයිතිවාසිකම පිළිගැනීම අරමුණු කරගත් යම් පියවර අදහස් විය යුතු අතර, ඊට-

(අ) ස්මාරක ඇතුළුව මියගිය තැනැත්තන් අනුස්මරණ ක්‍රම;

(ආ) යටිතල පහසුකම් සංවර්ධනය;

(ඇ) අධ්‍යාපනික වැඩසටහන්, පුහුණු කිරීම් සහ කුසලතා සංවර්ධන වැඩසටහන්;

(ඈ) ප්‍රජා සංවර්ධන වැඩසටහන් හෝ සේවා; සහ

(ඉ) පීඩාවට පත් ජන කොට්ඨාස විමසා හානිපූරණය සඳහා වන කාර්යාලය විසින් හඳුනාගනු ලැබූ වෙනත් සුදුසු වැඩසටහන්,

ඇතුළත් විය යුතු ය;

"මානව අයිතිවාසිකම්" යන්නෙන්, ශ්‍රී ලංකාවේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් පිළිගනු ලැබූ සියලු මූලික අයිතිවාසිකම් සහ ශ්‍රී ලංකාව විසින් අපරානුමත කරනු ලැබූ අන්තර්ජාතික මානව අයිතිවාසිකම් සම්මුතීන්හි අඩංගු අයිතිවාසිකම්වලට බලාත්මකභාවය ලබාදීමට පාර්ලිමේන්තුව විසින් පනවනු ලැබූ පනත්හි ඇතුළත් අයිතීන්, අදහස් විය යුතු ය;

"තනි හානිපූරණය" යන්නෙන්, තනි පීඩාවට පත් තැනැත්තකු සඳහා ඵලදායී ප්‍රතිකර්ම සහ ප්‍රතිලාභ සඳහා වන අයිතිවාසිකම් පිළිගැනීම අරමුණු කරගත් යම් පියවර අදහස් විය යුතු අතර, ඊට-

(අ) පීඩාවට පත් තැනැත්තකු සඳහා සපයන ලද යම් මූල්‍යමය ගෙවීම් හෝ ද්‍රව්‍යමය ප්‍රතිලාභ;

(ආ) ක්ෂුද්‍ර මූල්‍ය සහ සහනදායී ණය;

(ඇ) අධ්‍යාපනික වැඩසටහන්, පුහුණු කිරීම්, සහ කුසලතා සංවර්ධන වැඩසටහන්;

(ඈ) පීඩාවට පත් තැනැත්තකු සඳහා සපයන ලද මනෝ සාමාජීය සහාය ඇතුළු පරිපාලන සහාය, සහ සුභසාධන සේවා;

(ඉ) ඉඩම් සහ නිවාස සැපයීම ඇතුළු, ප්‍රතිෂ්ඨාපන පියවර; සහ

(ඊ) හානිපූරණය සඳහා වන කාර්යාලය විසින් හඳුනා ගනු ලැබූ වෙනත් සුදුසු පියවර,

ඇතුළත් විය යුතු ය;

මියගිය තැනැත්තකු හෝ අතුරුදහන් වූ තැනැත්තකු සම්බන්ධයෙන් "ඥාතීන්" යන්නට, පහත දැක්වෙන තැනැත්තන් ඇතුළත් විය යුතු යː-

(i) කලත්‍රයා;

(ii) ළමයින්;

(iii) දෙමාපියන්;

(iv) සහෝදරයන් හෝ සහෝදරියන්;

(v) නැන්දණියන්/මාමණ්ඩිවරු, මස්සිනාවරුන්/නෑනාවරුන්, බෑණාවරුන්/ලේලිවරුන්;

(vi) මුණුබුරු මිණිබිරියන් සහ සීයලා සහ ආච්චිලා,

"හානිපූරණය" යන්නට, තනි සහ සාමූහික හානිපූරණ ඇතුළත් විය යුතු ය.

**28.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.